**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය - 2022**

--------------------------------------------------------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබීම හේතුවෙන් ධාරණ අගය ශූනය වූ පිරිවැය රු.8,146,724 ක් වූ පුස්තකාල පොත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම මෙම පුස්තකාල පොත් තොගය 2020 වර්ෂයේ සිට සමීක්ෂණය කර නොතිබුණි. | 2023/2024 වසර තුලදී ප්‍රත්‍යාගණනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ආ) | එක් විදුලි මීටරයකින් ආයතනය හා කොළඹ විශ්වවිද්‍යාලයේ එක් පීඨයක් විදුලිය ලබාගෙන තිබුණු අතර ආයතනයේ විදුලි පරිභෝජන කොටස ලෙස 2019 සිට 2022 වර්ෂය දක්වා එකතුව රු.3,703,858ක් ගෙවන ලෙස කොළඹ විශ්වවිද්‍යාලය දැනුම් දී තිබුණ ද ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 හි 22 ඡේදය ප්‍රකාරව විදුලි ගාස්තු සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමක් 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම සිදුකර නොතිබුණි. | අධ්‍යාපන පීඨයට සහ NILIS යන දෙකටම ඇත්තේ එක විදුලි ගිණුමක් පමණක් බැවින් අධ්‍යාපන පීඨයට ලැබෙන මුළු විදුලි බිලෙන් 33.33%ක් කොළඹ විශ්වවිද්‍යාලය වෙත ගෙවිය හැකි බවට උපකුලපතිතුමා එකඟ විය. රජයේ ගිණුම්කරණ ප්‍රමිත අනුව නව අයවැය සකස් කිරීමේදී ඉදිරි වසර වෙනුවෙන් යම් ප්‍රමාණයක් වෙන් කිරීමට කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ඉකුත් වර්ෂයේ රු.398,000 ක් වූ උපචිත වියදම් සඳහා අධි වෙන්කිරීම පෙර වර්ෂයේ ලාභයට ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ වියදම්වලින් අඩුකර දැක්වීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයේදී නිවැරදි කිරීමට පියවර ගනු ලබන බව. | ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවට ලැබී තිබුණු රු.776,850 ක් වූ සෘජු ප්‍රේෂණ වර්ෂයේ ආදායම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | මේ වනවිට එම මුදලින් රු.490,950ක් හඳුනාගෙන ඇති අතර දැනට ඉතිරිව ඇත්තේ රු 285,900.00 ක ප්‍රමාණයකි. මෙම මුදලද හඳුනා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | සෘජු බැර කිරීම් කාලීනව හඳුනාගෙන අදාළ වර්ෂයේදී ආදායමට බැර කිරීම සිදුකළ හැකි පරිදි ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශිෂ්‍ය ආදායම තුළ වර්ෂ 01 ට වඩා වැඩි රු.2,685,280 ක ශේෂයක් පැවති අතර එම ශිෂ්‍ය ආදායම අය කර ගැනීමට අපොහොසත් වී තිබුණි. | වසර 2කට වඩා වැඩි ලැබිය යුතු පාඨමාලා ගාස්තු පාඨමාලා හැර ගිය සිසුන්ගේ වේ. ඔවුන්ගේ පාඨමාලා කාලය අවුරුදු 03 ඉක්මවූ පසු කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ලේඛණ වලින් ඉවත් කිරීමට කටයුතු කරනු ලබන බව. | ඒ ඒ ගිණුම් වර්ෂයට අදාළව ලැබිය යුතු ආදායම අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 7 හා 8 වගන්ති හා 2007 ජුනි 12 දිනැති අංක 15/2007 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | යොමුගත රෙගුලාසිවලට පටහැනිව 1996 ඔක්තෝබර් 14 දිනැති අංක 691 දරන විශ්වවිද්‍යාල කොමිෂන් සභා චක්‍රලේඛය පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේදී නිලධාරීන් තිදෙනෙකු සඳහා රු 220,000. ක වාහන ණය ලබාදී තිබුණි. | 1996 ඔක්තෝම්බර් 14 දිනැති අංක 691 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය පදනම් කරගනිමින් වාහන ණය ලබාදීම සිදු කරනු ලබයි. අංක 691 චක්‍රලේඛය අවලංගු කර නොමැති අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ප්‍රතිග්‍රහනය (adopt ) කර නොමැති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය සහ 2017 ජූලි 10 දිනැති අංක 10/2017 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හතර දෙනෙකුගේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී රු.28,789,031 ක් වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමා, අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම පිළිබඳ පොදු ක්‍රමවේදයකට යෝජනා ඉදිරිපත් කරන ලෙස උප කුලපතිවරුන්ගේ කමිටුවට (CVCD) දන්වා ඇත. ඒ අනුව ඉදිරියේදී කටයුතු කරන අතර එතෙක් පැමිණීමේ ලේඛනයක් පවත්වා ගැනීමට කටයුතු කරන ඇති බව. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1995 ජුලි 14 දිනැති අංක 636 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේ පවත්වා තිබූ විභාග 03 ක ප්‍රතිඵල නිකුත් කිරීම දින 123 සිට දින 190 ක කාලයක් ප්‍රමාද වී තිබුණු අතර විභාග 07ක ප්‍රතිඵල 2023 පෙබරවාරි 28දින | කොවිඩ් -19 තත්ත්වය හේතුවෙන් සහ මාර්ගගත ක්‍රමයට සිදුකරන විෂයන්වල පිළිතුරු පත්‍ර එවලේම whatsapp ක්‍රමයට ගෙන්වා ගත්තද තැපැල් මඟින් ලැබීමෙන් පසුව පිළිතුරු පත්‍ර පරීක්ෂා කිරීම යනාදී කරුණු හේතු වූ බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

වනවිටත් නිකුත් කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.3,229,596 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.5,136,404 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.8,366,000 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ පුනරාවර්තන ප්‍රදාන සහ ආයතනයේ ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2009 අගෝස්තු 27 දින ලබාදී තිබුණු අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ගුරු සේවා ව්‍යවස්ථාවට ගුරු පුස්තකාලයාධිපති පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, ශාස්ත්‍රපති පාඨමාලාව හා ඩිප්ලෝමා පාඨමාලාව ඇතුළත් කළ යුතු වුවද අධ්‍යාපන අමාත්‍යාංශය ඊට අදාළ කටයුතු සිදුකර නොතිබීම හේතුවෙන් එම පාඨමාලා සඳහා ගුරුභවතුන් ඉල්ලුම් කර නොතිබුණි. එබැවින් උක්ත පාඨමාලා 2014 වර්ෂයේ සිට 2019 වර්ෂය අතර කාලය තුල අත්හිටුවා තිබුණි. ආයතනය පිහිටුවීමේ අරමුණු අනුව ඉලක්කගත ගුරු පුස්තලායාධිපතින් පාඨමාලා සඳහා ඉල්ලුම් නොකිරීම ආවරණය කරගැනීම සඳහා වෙනත් කණ්ඩායම් ඉලක්ක කරගනිමින් පුස්තකාල තොරතුරු අධ්‍යයන පාඨමාලා හා කෙටිකාලීන පාඨමාලා ක්‍රියාත්මක කිරීමට 2017 වර්ෂයේ සිට ආයතනය කටයුතු කර තිබුණි . | පාසල් පුස්තකාල 4000ක් සංවර්ධනය කර එම පුස්තකාල සඳහා ගුරු පුස්තකාලයාධිපතිවරුන් 4000ක් බඳවා ගෙන ලෝක බැංකු ආධාර යටතේ 1998 දී ශ්‍රී ලංකාවේ දියත් කරන ලද සාමාන්‍ය අධ්‍යාපන ව්‍යාපෘතියේ දෙවන සංරචකයට (GEP 2) අනුව ඔවුන් පුහුණුකිරීම වැඩිදුර උසස් අධ්‍යාපන සුදුසුකම් ලබා දීමට ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනය පිහිටුවා තිබුණි.<br>ගුරු පුස්තකාලයාධිපතිවරුන්ගේ උසස්වීම්වලට අදාළ වන පරිදි ගුරු සේවා ව්‍යවස්ථාව සංශෝධනය කිරීම අධ්‍යාපන අමාත්‍යාංශය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කළයුතු කාර්යයක් වේ. මේ සම්බන්ධව අධ්‍යාපන අමාත්‍යාංශය සහ අනෙකුත් අදාල පාර්ශවයන් නැවත නැවත දැනුවත් කිරීමට සහ සාකච්ඡා තුළින් ඒ සඳහා මැදිහත් වී කටයුතු කිරීමේ වගකීම අප ආයතනය මගහැර නොමැති බව. | ආයතනය පිහිටුවීමේ අරමුණු අනුව ඉලක්ක සපුරා ගැනීමට ක්‍රියාකල යුතුය. |